www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ විරුද්ධ පක්ෂය කම්කරුවන්ගේ සහ ගොවීන්ගේ අරගල නරුම ලෙස ගසාකයි

## Sri Lankan opposition cynically exploits struggles of workers and farmers

**ඩබ්ලිව්. ඒ. සුනිල්**
**2004 පෙබරවාරි 14**

---

ජාත්‍යන්තර මූල්‍ය ප්‍රාග්ධනය වෙනුවෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව විසින් ඉල්ලා සිටිනු ලබන ආර්ථික ප්‍රතිසංස්කරන පියවරයන්ගේ බලපෑමට එරෙහිව කම්කරුවන්, ගොවීන් සහ තරුන ජනයා අතර වැඩෙන විරුද්ධත්වය ලංකාවේ ගැඹුරු දේශපාලන අබුදයේ ප්‍රධාන සාධකයකි. ආයෝජකයන් සඳහා මූල්‍ය සහ සෙසු දිරිගැන්වීම් සමග පුද්ගලීකරනයේ සහ මහජන වියදම් කප්පාදු කිරීමේ පිලිවෙත් පොහොසතුන් සහ දුප්පතුන් අතර පරතරය වැඩි දියුනු කරමින් දුප්පත්කම සහ විරැකියාව ඉහල නංවා ඇත.

වර්ජන සහ විරෝධතා ව්‍යාපාරවල ක්ෂනික ඉලක්කය එක්සත් ජාතික පෙරමුනු (එජාපෙ) ආන්ඩුව වන නමුදු එහි ක්‍රියාමාර්ගය, ඊට පෙර පැවති ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංගගේ පොදු පෙරමුනු (පොපෙ) ආන්ඩුව විසින් පවත්වා ගෙන ආ පිලිවෙත්වල අඛන්ඩතාවකි. තමන් ඊට වඩාත් සටන්කාමී විකල්පයක් ලෙස පෙනී සිටිමින්, සමාජවාදී වෙස්පෑමක යෙදෙන සිංහල ස්වෝත්තමවාදී සංවිධානයක් වූ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ), ප්‍රධාන පක්ෂ දෙක සහ පොදු පෙරමුනේ හවුල්කරුවන් වන, සැකිලි බවට පත්ව තිබෙන ලංකා සමසමාජ පක්ෂය (ලසසප) සහ කොමියුනිස්ට් පක්ෂය (කොප) කෙරෙහි පුලුල්ව පැතිරුනු අතෘප්තිය සිය වාසියට හරවාගෙන ඇත.

මැත ම වර්ජන සහ විරෝධතා රැල්ල පැන නැගුනේ, ජවිපෙ සහ කුමාරතුංගගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) අතර ජනවාරි 20 දින සන්ධානයක් අත්සන් කිරීමෙන් පසුව ය.

එජාපෙ ආන්ඩුවට පහර ගැසීම සඳහා පමනක් නො ව ආන්ඩුව බලයෙන් නෙරපීම සඳහා කුමාරතුංග මත යොදන පීඩනය තීව්‍ර කිරීමට ද, ශ්‍රීලනිපයේ කොටසක් සමග එක්ව ජවිපෙ මෙම සෑම සිද්ධියකදී ම මහජන අතෘප්තිය නරුම ලෙස ගසා කැවේ ය. දෙමල විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) සමග සාම සාකච්ඡාවල දී රට විකිනීම ගැන ජවිපෙ සිංහල අන්තවාදී වාචාලයන් මාස ගනනාවක සිට ම අගමැති රනිල් වික්‍රමසිංහ හෙලා දකිමින් සිටියේ ය.

අවසානයේ දී පෙබරවාරි 7 කුමාරතුංග විසින් එජාපෙ ආන්ඩුව නෙරපා හැරීමෙන් පසු, අප්‍රේල් 2 මැතිවරනයේ දී ඔවුන්ගේ සන්ධාන ආන්ඩුවක් බලයට පත් වූ විට සියලු ප්‍රශ්න විසඳන බව ප්‍රකාශ කරමින් නොයෙකුත් අරගල වහාම විසුරුවා දැමී ය. මෑත සියලුම වර්ජන සහ විරෝධතාවල දී මෙම මුලා කිරීමේ ක්‍රමය මනාව පැහැදිලි ය.

### ජාතික දුම්රිය අරගලය

අලුතෙන් පිහිටුවන ලද ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය අහෝසි කරන ලෙස ඉල්ලමින් ආන්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කරන 17,000 පමන වූ මුලු ශ්‍රම බලකාය ම වාගේ ජනවාරි 26 අඛන්ඩ වැඩ වර්ජනයක් ආරම්භ කලෝ ය. අධිකාරිය, ආන්ඩුව යටතේ පාලනය කෙරුන පැරනි දුම්රිය දෙපාර්තමේන්තුව විස්ථාපනය කරන ස්වාධීන, වානිජමය ආයතනයක් වන අතර සම්පූර්න පුද්ගලීකරනය දෙසට තබන එක් පියවරකි. තමන්ගේ රැකියා සහ දිගුකාලීනව තහවුරු කෙරී ඇති සේවා කොන්දේසි සහ අයිතිවාසිකම් අහිමි වනු ඇතැයි දුම්රිය කම්කරුවෝ බියට පත්ව සිටිති.

පසුගිය වසරේ කම්කරුවන් වර්ජනය කල විට දී නව අධිකාරිය යටතේ විශ්‍රාමලාභීන් සඳහා ඉහල වන්දියක් ගෙවීමට සහ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ප්‍රවාහන ඇමති තිලක් මාරපන සහතික වූ බව ප්‍රකාශ කරමින් නායකයෝ ඔවුන් ආපසු වැඩට යැවූහ. කෙසේ නමුත් මෙම සහතිකවීම් තිබිය දී ම ආන්ඩුව දුම්රිය පද්ධතියේ කොටස් පුද්ගලික අංශයට පැවරීමටත් දුම්රිය දේපල විකිනීමත් ආරම්භ කලේ ය. එජාපෙ ගැති වෘත්තීය සමිතිවලට පවා වර්ජනයට සහයෝගය දීමට බල කෙරුනේ කම්කරුවන් අතර ඒ කෙරෙහි ඇති වූ කෝපය නිසාවෙනි. දෛනික දුම්රිය සේවාවන් 320 සිට 20 දක්වා පහත වැටීම නිසා සම්පූර්න දුම්රිය ජාලය ම පාහේ ඇනහිටියේ ය. ජනවාරි මාසයේ දී දුම්රිය ගාස්තු සියයට 40 සිට 60 දක්වා ඉහල දැමීමට තීන්දු කිරීම ගැන දුම්රිය මගීන් කෝපයට පත්ව සිටීම නිසා, කම්කරුවන්ට අවලාද නගමින් වර්ජකයන්ට එරෙහිව මහජන සහයෝගය ගොනු කිරීමට ආන්ඩුව දැරූ තැත මුලුමනින් ම අසාර්ථක විය.

වර්ජනය අවසන් කිරීමේ තැතක් ලෙස අගමැති සහ ප්‍රවාහන ඇමති යන දෙදෙනා ම වෘත්තීය සමිති නායකයන් සමග සාකච්ඡා වට ගනනාවක් පැවැත් වූහ. එජාපෙ ගැති සමිති නායකයන් සමග දීඝ සාකච්ඡාවලින් පසුව, දුම්රිය අධිකාරිය පිහිටුවීම වසර

දෙකකට කල්තබන බවට පොරොන්දු වන අවබෝධතා ගිවිසුමකට එලඹී බව ආන්ඩුව නිවේදනය කලේ ය. ඊට අමතරව දුම්රිය දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතුවලට වෘත්තීය සමිති නියෝජිතයන් සම්බන්ධ කර ගනු ලබ යි. එකඟතාවය නින්දිත පාවාදීමක් ලෙස ක්ෂනිකව හෙලා දුටු ශ්‍රීලනිප සහ ජවිපෙ නායකත්වයන් දෙනු ලබන වෘත්තිය සමිති වර්ජනය පෙරට ගෙන යන බව ප්‍රකාශ කලහ. නමුත් පූච්ඡානම තිබුනේ පැය 48 ක් පමනි. භාරකාර ආන්ඩුවක් පමනක් බලයේ සිටින විට වැජනය පෙරට ගෙනයාම තේරුමක් නැතැ යි ප්‍රකාශ කරමින් කුමාරතුංග පාර්ලිමේන්තුව විසුරුවීමේ දිනට පසු දින මෙම නායකයෝ ම වර්ජනය අත්හිටවූහ. අනාගත ජවිපෙ-ශ්‍රීලනිප ආන්ඩුවක් යටතේ ඉල්ලීම් ගැන සලකා බලන බවට ඔවුහු පොරොන්දු වූහ.

## කම්කරු නීති සංශෝධනය

කම්කරුවන් තොග පිටින් දොට්ට දැමීම හාම්පුතුන්ට වඩා පහසු කරන ආන්ඩුවේ කම්කරු නීති සංශෝධනයන්ට පුද්ගලික අංශයේ කම්කරුවන් අතර පැතිරුනු විරුද්ධත්වයක් ඇත. ජනවාරි මාසයේ සම්මත කල සේවය අවසන් කිරීමේ සංශෝධන පනත යටතේ කම්කරුවන්ගේ රැකියා අහෝසි කිරීමේ දී ගෙවනු ලබන වන්දි ප්‍රමානයන් ගැන තීන්දු කිරීමට තවදුරටත් කම්කරු කොමසාරිස්ට බලයක් නැත. ඒ වෙනුවට නිත්‍ය සූත්‍රයක් අනුව පහල මට්ටමේ වන්දි ගෙවීම් කරනු ලබ යි.

සැලසුම් කර තිබූ සංශෝධනයන්ට එරෙහිව පසුගිය දෙසැම්බරයේ ලංකා වෙලඳ සේවක සංගමය එක්දින වර්ජනයක් කැඳවූ අතර සංශෝධන පනත් සම්මත කලොත් මහාවර්ජනයක් කැඳවුම් කරන බවට තැජනය කලේ ය. ඉන්පසු සීඑම්යූ නිලධරය කිසිදු පියවරක් නො ගත්තේ ය.

කෙසේ නමුත් ප්‍රශ්නය ගසාකෑමට ජවිපෙ තීන්දු කලේ ය. ශ්‍රීලනිපය සමග සන්ධාන ගිවිසුම අත්සන් කිරීමට පෙර දින ජනවාරි 19 ජවිපෙට සම්බන්ධ අන්තූ සමාගම් සේවක සංගමය කම්කරු අමාත්‍යංශය ඉදිරිපිට උපවාසයක් සංවිධානය කලේ ය. පනත් සංශෝධනයන් අවලංගු කරන තුරු උපවාසය නො නවත්වා පෙරට ගෙන යන බවට ජවිපෙ සමිති නිලධරයන් ගිගුරුම් දුන් අතර දිනකට කම්කරුවන් පහක් හෝ හයක් කාර්යාලයන්හි පෙනී සිටියහ.

කෙසේ නමුත් පෙබරවාරි 9 තාලය ඉක්මනින් ම වෙනස් විය. උපවාසයේ යෙදී සිටි කම්කරුවන් අතලොස්සක් හමුවට ගිය අන්තර් සමාගම් සේවක සංගමයේ නායකයෝ විරෝධතාවය තව දුරටත් අවශ්‍ය නො වන බව නිවේදනය කලහ. "සාකච්ඡා කිරීමට බලධාරි ආන්ඩුවක් නැහැ. මැතිවරනයෙන් පසුව බලයට එන අනාගත ආන්ඩුවක් සමග මෙම ප්‍රශ්න සාකච්ඡා කරනවා" යැයි ඔවුහු ප්‍රකාශ කලහ.

## සෞඛ්‍ය කම්කරුවෝ

පසුගිය වසරේ පැවති දීපව්‍යාප්ත අඛන්ඩ වැඩ වර්ජනය කෙලවර කිරීම සඳහා දුන් පොරොන්දු ආන්ඩුව විසින් බිඳ දැමීම නිසා සෞඛ්‍ය අංශයේ කම්කරුවන්ට වර්ජන ක්‍රියාවකට යාමට බල කෙරුනි. වහාම වැටුප් විෂමතාවන් ඉවත් කරන ලෙස ඉල්ලමින් රජයේ රෝහල්වල වෛද්‍ය නො වන කාර්යමන්ඩලයේ 80,000 ක් පමන වර්ජනයට සම්බන්ධ වූහ. කෙසේ නමුත් කොටස් වසයෙන් වර්ජකයන්ට ගෙවීමට එකඟ වූ වැටුප් වැඩිවීම්වලට හිඟ වැටුප් ඇතුලත් වූයේ නැත. එසේ වුවත් සමිති නායකයෝ පෙබරවාරි 2 වර්ජනය අත්හිට වූ අතර ඉන් ඔබ්බට කිසිදු උද්ඝෝෂන ක්‍රියාවක් සැලසුම් නො කලහ.

## ගොවි විරෝධතාවය

ආදායම් දරුනු ලෙස බාදනය කෙරුන ආන්ඩුවේ ක්‍රියාවන්ට එරෙහිව කුඩා ගොවීන් අඛන්ඩව විරෝධතා ව්‍යාපාරවල යෙදී සිටියහ. කිලෝ ග්‍රෑම් 50 ක පොහොර බෑගයක මිල රුපියල් 500 සිට 850 දක්වා ඉහල දැමූ පොහොර සහනාධාරය කප්පාදු කිරීමේ පසුගිය අවුරුද්දේ තීන්දුව විශේෂයෙන් ගොවීන්ගේ කෝපය ඇවිස්සීමට හේතු විය. ජනවාරි මාසයේ පමනක් හම්බන්තොට, අනුරාධපුර සහ කැබිතිගොල්ලෑව නගර අවට ප්‍රදේශවල විරෝධතා ව්‍යාපාර ගනනාවක් පැවැත්වුනි.

ගොවීන්ගේ ආරක්ෂකයන් ලෙස පෙනී සිටීමට උත්සාහ කරමින්, ජවිපෙ පෙබරවාරි 2 කොලඹ දී ගොවි උපවාසයක් ආරම්භ කලේ ය. කෙසේ නමුත් කම්කරු වර්ජන මෙන් ම මෙම විරෝධතා ව්‍යාපාරය ද කුමාරතුංග එජාපෙ, ආන්ඩුව නෙරපා දැමූ විට හදිසියේ ම නතර කරනු ලැබී ය. ජවිපෙ නායක විමල් වීරවංශ සහ ශ්‍රීලනිප පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර බන්ඩාරනායක - කුමාරතුංගගේ සහෝදරයා - විරෝධතා ව්‍යාපාරය ඉදිරියේ පෙනී සිටිමින් උපවාසය නතර කරන ලෙස ගොවීන්ගෙන් ඉල්ලා සිටියහ. විසඳන ආකාරය ගැන පැහැදිලි කිරීමකින් තොරව "ශ්‍රීලනිප-ජවිපෙ සන්ධානයේ අනාගත ආන්ඩුවක් මගින් ගොවීන්ගේ ප්‍රශ්න විසඳන" බව අනුර බන්ඩාරනායක ප්‍රකාශ කලේ ය. පසු දින කුමාරතුංගගේ පාලනය යටතේ ඇති ආන්ඩුවේ සියලුම මාධ්‍ය විසින් ඔහුගේ ප්‍රකාශයට ප්‍රමුඛතාවක් ලබා දුනි. ආන්ඩුවට හෝ විරුද්ධ පක්ෂවලට මොන ම විසඳුමක් වත් නැති වඩ වඩාත් නරක අතට හැරෙන සමාජ කොන්දේසි කෙරෙහි වැඩ කරන ජනයාගේ පලල් ස්ථර අතර පවතින අතෘප්තියේ සහ කෝපයේ මට්ටම වර්ජන සහ විරෝධතා මගින් එලිදරව් කෙරෙයි. ඔවුන් බලයට ආවොත් සියලු ප්‍රශ්න විසඳන බවට ජවිපෙ සහ ශ්‍රීලනිප නායකයන් පොරොන්දු වන නමුත් සන්ධානයේ ඒකාබද්ධ වේදිකාව "විදේශ ආයෝජන උපරිම කිරීමට" කැප වෙයි. මෙහි එකම අර්ථය වන්නේ ආර්ථික ප්‍රතිව්‍යුහකරනයන් පෙරට ගෙන යාම සහ සාමාන්‍ය ජනයාගේ සමාජ තත්වයන්ට එල්ල කරන ප්‍රහාර ගැඹුරු කිරීම ය.

© www.wsws.org